# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1726/6 - 2011 ඔක්තෝබර් 04 වැනි අඟහරුවාදා - 2011.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 37.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සියලු විදුලි සහ/හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ/උපකරණ/උපාංග සඳහා අවම වශයෙන් අදාළ භාණ්ඩ විකුණනු ලබන දින සිට හෝ එම භාණ්ඩයේ සන්තකය ගැණුම්කරු වෙත පැවරුන දින සිට හෝ මාස හයකට (06) නොඅඩු කාලයක් බලපැවැත්වෙන පරිදි ප්‍රතිඥාභාරයක් (වගකීමේ කාලයක්) ලබාදිය යුතු බවට අදාළ සියළු විදුලි සහ/හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ/උපකරණ/උපාංග සාදන්නන්/වෙළෙන්දන්/ආනයනකරුවන්/සපයන්නන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙසේ විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2011 ඔක්තෝබර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

තවද, 2005 අගෝස්තු මස 26 වැනි දින අංක 1407/23 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 05 දරන විධානය මෙයින් අවලංගු කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2011 ඔක්තෝබර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

10-407